# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 1850/36 – 2014 පෙබරවාරි 19 වැනි බදාදා – 2014.02.19**

**(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)**


# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

38 වැනි වගන්තිය (අ) අතුරු විධානය යටතේ ආඥාව

**2014 අංක 39 දරන ආඥාව**

මගේ යොමු අංකය: 4-3/7/2011/එච්ඩබ්/58.
ප්‍රාදේශීය ලේකම්ගේ යොමු අංකය: 3/3/12/2.

ඉඩම් අත්කර ගැනීමේ පනතේ (460 වැනි පරිච්ඡේදය) 38 වැනි වගන්තියේ (අ) අතුරු විධානයෙන් මා වෙත පවරා ඇති බලතල අනුව, ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍ය ජනක බණ්ඩාර තෙන්නකෝන් වන මම පහත සඳහන් උපලේඛනයේ 1 වැනි ඡේදයේ සඳහන් ඉඩම් අත්කර ගැනීමේ නිලධාරියාට නැතහොත්, එකී නිලධාරියා විසින් ඒ සඳහා බලය දෙන ලද වෙනත් නිලධාරියකුට, එම උපලේඛනයේ 2 වැනි ඡේදයේ දැක්වෙන නියමිත ඉඩම ස්වාමිත්වයට ගැනීමට මෙයින් නියම කරමි.

ජනක බණ්ඩාර තෙන්නකෝන්,
ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍ය.

2014 පෙබරවාරි මස 06 වැනි දින,
ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍යාංශය,
අංක 1200/6, "මිහිකත මැදුර",
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

උපලේඛනය

1. **ඉඩම් අත්කර ගැනීමේ නිලධාරියා.**– ප්‍රාදේශීය ලේකම්, පදියතලාව.

2. **ඉඩමේ විස්තරය.**– නැගෙනහිර පළාතේ, අම්පාර දිස්ත්‍රික්කයේ, පදියතලාව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, බිං තැන්නපත්තු දකුණ සුළු කොට්ඨාසයේ, කෙහෙලුල්ල මීගස්වත්ත පදියතලාව, සෙරන්කඩ සහ පළතුරුවේල්ල යන ගම්වල පිහිටි සර්වේයර් ජනරාල් විසින් පිළියෙල කරන ලද අංක AM/RDA/2009/264 හා 2010.03.05 දිනැති අනුරේඛණයේ සවිස්තරව දැක්වෙන ප්‍රමාණයෙන් හෙක්. 0.0130 ක් පමණ වන පහත සඳහන් නම් වලින් හා ප්‍රමාණ වලින් යුත් ඉඩම් කැබලි වලට මායිම්:

01. **කැබලි අක්ෂර 'ඉසෙඩ්' – පදියතලාව – ප්‍රමාණය: හෙක්. 0.0021 ක් පමණ**

උතුරට: කැබලි අක්ෂර ඒ; නැගෙනහිරට: රජය සහ පදියතලාව හිමිකම් කියන ගල, ලක්ෂ්මන් කුමාරසිරි හිමිකම් කියන වත්ත; දකුණට: රජය හිමිකම් කියන ගල සහ කැබලි අක්ෂර ඒ; බටහිරට: කැබලි අක්ෂර ඒ.

02. **කැබලි අක්ෂර 'ඒඒ' – පදියතලාව – ප්‍රමාණය: හෙක්. 0.0005 ක් පමණ**

උතුරට: කැබලි අක්ෂර ඒ; නැගෙනහිරට: රජය සහ පදියතලාව හිමිකම් කියන ගල, එස්. ඩබ්. ඒ. අජිත් නිෂාන්ත හිමිකම් කියන වත්ත; දකුණට: ඩබ්. ඒ. ලීලාවතී සහ වෙනත් අය හිමිකම් කියන පදියතලාව වත්ත, කැබලි අක්ෂර ඒ; බටහිරට: කැබලි අක්ෂර ඒ.

03. **කැබලි අක්ෂර 'ඒබී' – පදියතලාව – ප්‍රමාණය: හෙක්. 0.0009 ක් පමණ**

උතුරට: එන්. සී. ගජධීර සහ වෙනත් අය හිමිකම් කියන පදියතලාව වත්ත සහ කැබලි අක්ෂර ඒ; නැගෙනහිරට: කැබලි අක්ෂර ඒ; දකුණට: කැබලි අක්ෂර ඒ, බී. ආර්. කුලතුංග සහ වෙනත් අය හිමිකම් කියන පදියතලාව වත්ත; බටහිරට: ඩබ්. ඒ. ජයරත්න හිමිකම් කියන පදියතලාව වත්ත.



*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

04. **කැබලි අක්ෂර 'ඒසී' – පදියතලාව – ප්‍රමාණය: හෙක්. 0.0017 ක් පමණ**

උතුරට: බී. ආර්. කුලතුංග සහ වෙනත් අය හිමිකම් කියන පදියතලාව වත්ත සහ කැබලි අක්ෂර ඒ; නැගෙනහිරට: කැබලි අක්ෂර ඒ; දකුණට: කැබලි අක්ෂර ඒ සහ එන්. සී. ගජධීර හිමිකම් කියන පදියතලාව වත්ත; බටහිරට: බී. ආර්. කුලතුංග සහ වෙනත් අය හිමිකම් කියන පදියතලාව වත්ත.

05. **කැබලි අක්ෂර 'ඒඩී' – පදියතලාව – ප්‍රමාණය: හෙක්. 0.0028 ක් පමණ**

උතුරට: කැබලි අක්ෂර ඒ සහ ඩබ්. ඒ. ලීලාවතී සහ වෙනත් අය හිමිකම් කියන පදියතලාව වත්ත; නැගෙනහිරට: ඩබ්. ඒ. ලීලාවතී හිමිකම් කියන පදියතලාව වත්ත; දකුණට: කැබලි අක්ෂර ඒඊ සහ ඒ; බටහිරට: කැබලි අක්ෂර ඒ.

06. **කැබලි අක්ෂර 'ඒඊ' – පදියතලාව – ප්‍රමාණය: හෙක්. 0.0013 ක් පමණ**

උතුරට: කැබලි අක්ෂර ඒ, ඒඩී සහ ඩබ්. ඒ. ලීලාවතී හිමිකම් කියන පදියතලාව වත්ත; නැගෙනහිරට: ඩබ්. ඒ. ලීලාවතී හිමිකම් කියන පදියතලාව වත්ත; දකුණට: ඩබ්. ඒ. ලීලාවතී හිමිකම් කියන පදියතලාව වත්ත සහ කැබලි අක්ෂර ඒ; බටහිරට: කැබලි අක්ෂර ඒ.

07. **කැබලි අක්ෂර 'ඒඑෆ්' – පදියතලාව – ප්‍රමාණය: හෙක්. 0.0030 ක් පමණ**

උතුරට: කැබලි අක්ෂර ඒ සහ කේ. එම්. ෆාරුක් සහ වෙනත් අය හිමිකම් කියන පදියතලාව වත්ත; නැගෙනහිරට: ඩබ්. එම්. ගුණවර්ධන සහ වෙනත් අය හිමිකම් කියන පදියතලාව වත්ත; දකුණට: ඩබ්. එම්. ගුණවර්ධන සහ වෙනත් අය හිමිකම් කියන පදියතලාව වත්ත සහ කැබලි අක්ෂර ඒ; බටහිරට: කැබලි අක්ෂර ඒ.

08. **කැබලි අක්ෂර 'ඒඅයි' – පදියතලාව – ප්‍රමාණය: හෙක්. 0.0007 ක් පමණ**

උතුරට: ඊ. ජේ. පී. අනුෂා ප්‍රියන්තිකා සහ වෙනත් අය හිමිකම් කියන පදියතලාව වත්ත සහ කැබලි අක්ෂර ඒ; නැගෙනහිරට: කැබලි අක්ෂර ඒ; දකුණට: කැබලි අක්ෂර ඒ සහ ඊ. ජේ. පී. අනුෂා ප්‍රියන්තිකා සහ වෙනත් අය හිමිකම් කියන පදියතලාව වත්ත; බටහිරට: ඊ. ජේ. පී. අනුෂා ප්‍රියන්තිකා හිමිකම් කියන පදියතලාව වත්ත.

03 – 100

## ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

38 වැනි වගන්තිය (අ) යටතේ ආඥාව

**2013 අංක 322 දරන ආඥාව**

මගේ යොමු අංකය: 13/97/FR/108.

ප්‍රාදේශීය ලේකම්ගේ යොමු අංකය: උදු/2/5/2/39.

1972 අංක 18 සහ 1974 අංක 29 දරන අර්ථ නිරූපන (සංශෝධිත) පනත් වලින් සංශෝධිත අර්ථ නිරූපන ආඥාපනතේ (12 වන අධිකාරය) 18 වැනි වගන්තියට අනුකූලව ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍ය ජනක බණ්ඩාර තෙන්නකෝන් වන මම අංක 1837/34 හා 2013.11.21 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාත්‍රාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* පළකරන ලද ඉඩම් අත්කර ගැනීමේ පනතේ (460 වන පරිච්ඡේදය) 38 වැනි වගන්තිය (අ) ආඥාව යටතේ 2013 අංක 322 දරන ආඥාව මෙයින් අවලංගු කරමි.

ජනක බණ්ඩාර තෙන්නකෝන්,
ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍ය.

2014 ජනවාරි මස 28 වැනි දින,
ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍යාංශය,
අංක 1200/6, "මිහිකත මැදුර",
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

03 - 101

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.